# පණුහොරි (Scabies)

## 01. පණුහොරි (Scabies) යනු කුමක්ද?

- ඉතා කුඩා පරපෝෂී ජීවියෙක් (මයිටාවකු) නිසා ඇතිවන ආසාදනයකි. මෙය සෑම වයසකම සහ තරාතිරමකම අයෙකුට සෑදිය හැකිය.

- මෙය බෝවන රෝගයක් වන අතර රෝගියා ළඟින් ඇසුරු කරන්නන් අතර පැතිර යයි.

- ස්පර්ශය මගින්, පරිහරණය කරන ඇඳුම්, ඇඳ ඇතිරිලි ආදිය මගින් කෙනෙකුගෙන් තව කෙනෙකුට මෙම රෝගය බෝවිය හැකිය.

- වැඩි පිරිසක් ගැවසෙන ස්ථානවල (රෝහල්, පාසල්, පන්ති කාමර, වැඩිහිටි නිවාස, ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන, සිර කඳවුරු ආදිය) පහසුවෙන් පැතිර යයි.

## 2. මෙහි රෝග ලක්ෂණ මොනවාද?

- ඇඟිලි කරු, අත්, මැණික් කටුව අවට, පියයුරු හා ලිංගාශ්‍රිත ප්‍රදේශවල තද කැසීමක් සහිත කුඩා බිබිලි හට ගනී. කැසීම බහුලව සිදුවන්නේ රාත්‍රී කාලයේදීය.

- කුඩා දරුවන්ගේ නම් ඉහත ස්ථානවලට අමතරව මුහුණ, අත්ල සහ යටි පතුල්වලද බිබිලි ඇතිවිය හැක.

- මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ රෝගය වැළඳී සති 2 - 3 ක් යනතුරු රෝග ලක්ෂණ මතු නොවන බවයි.



සැකසුම - ශ්‍රී ලංකා චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය
Sri Lanka College of Dermatologists (SLCD) - www.slcd.lk

## 3. මේ සඳහා ඇති ප්‍රතිකාර මොනවාද ?

- රෝගියා සහ පවුලේ සාමාජිකයින් (රෝග ලක්ෂණ තිබුණත් නැතත්) සියල්ලෝම එකවර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුය.

- වෛද්‍ය උපදෙස් මත පමණක් ප්‍රතිකාර ලබාගත යුතු අතර ඒ සමගම සියලු ඇඳුම්, ඇඳ ඇතිරිලි, තුවා ආදිය හොඳින් සෝදා තද අව්වේ වියළා ගත යුතුය.

- ආලේපන ගල්වා ඇති ශරීරයේ යම් ප්‍රදේශයක් සේදීමට ලක් කළහොත් නැවත එම ප්‍රදේශයේ ආලේපන ගැල්වීම් කළ යුතුයි.

(i) **පර්මෙත්‍රින්** (Permethrin) **ප්‍රතිකාරය**

- මෙය බෙල්ලෙන් පහළ සිට පාදයේ ඇඟිලි දක්වා මුළු ශරීරයේම ආලේප කළ යුතුය.

- ආලේපනයට පෙර ස්නානය කර සම පිරිසිදු කර වියළා ගන්න. ඇතැම් විට ළදරුවන්ගේ හිසෙහි සහ මුහුණෙහි ද ආලේප ගැල්වීමට සිදුවිය හැකිය.

- ආලේපනය පැය 12 ක් ශරීරයේ ගල්වා තැබිය යුතුය. (උදා:- හවස 6.00 සිට පසුදින උදෑසන 6.00 තෙක්)

- පසු දා උදෑසන සියළු ඇඳුම් සෝදා ස්නානය කළ යුතුය.

- හරියටම දින 7 කට පසුව ඉහත ක්‍රියා පිළිවෙල නැවත අනුගමනය කළ යුතුය.

(ii) **සල්ෆර් (Sulphur) ප්‍රතිකාරය**

- එක දිගට දින 3ක් මෙය ආලේප කළ යුතුය. වරක් ගෑල් වූ පසු ආලේපනය පැය 24 ක් ශරීරයේ ගෑල්වී තිබිය යුතුය.

❖ රෝගියාට වඩාත්ම සුදුසු ප්‍රතිකාරය වෛද්‍යවරයා විසින් තීරණය කරනු ඇත.

❖ සමහර විට රෝගය සුවවී සති 2 - 3 යන තෙක් ඇඟ කැසීම පැවතිය හැකි බව සලකන්න. රෝගය දිගටම පවතින බවට යම් සැකයක් පවතී නම් නැවත ඔබේ වෛද්‍යවරයා හමු වන්න.